**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
சபரகமுவ மாகாணக் கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

**පළමු වාර පරීක්ෂණය - 2018** **11 ශ්‍රේණිය**

**Frist Term Test - 2018** **Grade 11**

**ව්‍යවසායකත්ව අධ්‍යයනය II**

**Enterprenaurship Studies II**

**කාලය පැය 1**

**One hour**

ප්‍රස්න සියල්ලටම පිළිතුරු සපයන්න

1. සමන් කළුතර ප්‍රදේශයේ වෙරළ ආසන්නයේ පදිංචි උ/පෙළ විභාගයට පෙනී සිටි ප්‍රතිඵල අපේක්ෂාවෙන් පසු වෙන සිසුවෙකි. මේ අතර නිවසේ අගහිඟකම දකින ඔහු කෙසේ හෝ මෙයට උරදිය යුතු යයි සිතයි.

ඔහු ඉගෙනගත් විෂය දැනුමෙන් ප්‍රයෝජන ගතයුතු යයි සිතා තමාට අඩු ප්‍රග්ධනයකින් යොමු විය හැකි නිෂ්පාදනයක් කෙරේ සිත යොමු කළහ. තමාගේ නිර්මාණශීලී චිත්‍ර හැකියාවෙන් හා නිර්මාණශීලී චින්තනයේ හැකියා වලින් ප්‍රයෝජන ගත හැකි අවම පිරිවැයකින් අරම්භ කළ හැකි පහසුවෙන් ලගා විය හැකි වෙළඳ පොළක් පවතින සංචාරකයින් සඳහා බිතු සිතුවම් නිර්මාණය කෙරෙහි ඔහු යොමු විය. ප්‍රදේශයේන් නොමිළේ ලබා ගත හැකි සිප්පි කටු පොල් හනසු හා විසිතුරු කොළ පැලැටි මල් යොදාගෙන අලංකාර චිත්‍ර නිර්මාණ වලට ඒවා එක් කරමින් සංචාරක සිත් පමනක් නොව දේශිය සංචාරක ආකර්ශනයද දිනා ගැනිමට ඔහු සමත් විය. ටික දිනකින් ඇති ඉල්ලුමත් සමඟ තව සේවකයින් දෙදෙනෙකු ව්‍යාපාරය හා එක් කර ගත්හ. දෛනිකව සේවකයෙකුට රුː 1500.00 බැගින්ද වෙනත් වියදම් සඳහා රුː 1500.00 දෛනිකව වැය කළ ඔහුට නිර්මාණ 06 ක් නිම කළහැකි විය. එය රුː 2000.00 බැගින් අළෙවි කළ ඔහු මෙම ව්‍යාපාරය විදේශ වෙළඳ පොළ කරාද යොමු කිරිමට අදහස් කර ගෙන සිටි.

(1) සමන් තුළ දැකිය හැකි ව්‍යවසායකත්ව ගති ලක්ෂණ 02
ලියන්න.

(2) ඔහු ව්‍යාපාරයක නිරත විමෙන් ලබාගත් ප්‍රතිලාභ 02
ලියන්න.

(3) මෙම ව්‍යාපාරයෙන් දේශිය ආර්ථිකයට හිමි වන
ප්‍රතිලාභ 02 ලියන්න.

(4) ඔහුට ව්‍යාපාරය සාර්ථක කර ගැනිමට අනුගමනය කළ
හැකි යැයි ඔබ සිතන ක්‍රියාමාර්ග 02 ලියන්න.

(5) ඔහුගේ නිර්මාණයක ඒකක පිරිවැය කීයද ? ඔහුට දෛනිකව ලැබෙන ලාභය
කොපමණද ?

2. (i) නව ව්‍යවසායකයකුට ප්‍රාග්ධනය සම්පාදනය කර ගත හැකි මාර්ග 02ක් දක්වන්න.

(ii) පහත සඳහන් ව්‍යාපාර අවස්ථා පවත්වාගෙන යාමට උචිත ව්‍යාපාර ස්ථාන කෙබඳු විය යුතුදැයි දක්වන්න.

(a) පාසල් ලිපිද්‍රව්‍ය අලෙවිය සමඟ පවත්වාගෙන යන ආපන ශාලාවක්.

(b) උත්සව ශාලාවක්.

(iii) ව්‍යාපාරයක පැවතිය හැකි අලෙවි වියදම් වර්ග 02ක් සඳහන් කරන්න.

(iv) ව්‍යාපාරයක නිශ්පාදන පිරිවැය සමන්විත වන ප්‍රධාන පිරිවැය වර්ග 03 නම් කරන්න.

(v) ව්‍යාපාර සැලැස්මක් නොමැතිව ආරම්භ කළ ව්‍යාපාරයකට මතු විය හැකි ගැටළු 02ක් සඳහන් කරන්න.

3. (i) ව්‍යවසායකුට සමාජ සුභසාධනය සඳහා දායක විය හැකි ක්‍රම 02ක් දක්වන්න.

(ii) කුඩා ව්‍යාපාරයක් සාර්ථක වීම සඳහා බලපෑ හැකි ශක්තීන් 02ක් සඳහන් කරන්න.

(iii) ව්‍යවසායකත්වය තුලින් දේශීය ආර්ථිකයට අත්වන ප්‍රතිලාභ 04ක් සඳහන් කරන්න.

(iv) පුද්ගලයකුට පවතින අවශ්‍යතා දෙකක් දක්වා , ඒවා තුලින් පැන නගින වුවමනා දෙක බැගින් දක්වන්න.

(v) සමාජය තුළ දැකිය හැකි ව්‍යවසායකයන් වර්ග අතුරෙන් දෙදෙනෙකු නම් කරන්න.

4. (i) පුද්ගලයෙකුට නිර්මාණශීලීත්වය වර්ධනය කරගත හැකි ආකාර 02ක් දක්වන්න.

(ii) ව්‍යපාරිකයකු හා ව්‍යවසායකයකු සසඳන කල , ඔවුන් දෙදෙනා අතර පවතින වෙනස්කම් 02ක් සඳහන් කරන්න.

(iii) ව්‍යාපාර පරිසරය අවබෝධ කර ගැනීමෙන් ව්‍යවසායකයාට ලබාගත හැකි ප්‍රයෝජන 02ක් දක්වන්න.

(iv) නිර්මාණශීලී ව්‍යපාර අවස්ථා මතු කර ගැනීමට හැකි , ශ්‍රී ලංකාවේ පවතින මානව නොවන සුලභ සම්පත් 02ක් නම් කර උදාහරණ සපයන්න.

(v) කාන්තාවන්ට වර්තමානයේ ව්‍යවසායකයන් වීමට පොළඹවන සාදක 02ක් නම් කරන්න.

5. (i) " ව්‍යාපාර සැලැස්ම " යන්න හඳුන්වන්න.

(ii) ව්‍යාපාර සැලැස්මක ප්‍රධාන මූලිකාංග 04ක් නම් කරන්න.

(iii) " වෙළඳපල හිඩැසක් " යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද ?

(iv) නිර්මාණාත්මක ව්‍යාපාර අදහසකට රජයෙන් ලබාදෙන නෛතික ආවරණය කුමක්ද ? එය කෙටියෙන් පැහැදිලි කරන්න.

(v) පහත සඳහන් භාණ්ඩ හා සේවා සඳහා ඉලක්ක පාරිභෝගිකයා කවරෙක්දැයි දක්වන්න.

(a) වන්දනා චාරිකා
(b) අධ්‍යාපනික පුවත්පත්
(c) විසිතුරු අත් බෑග්
(d) ළදරු නිෂ්පාදන

6. (i) නිෂ්පාදන සැලැස්මක් යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) නිෂ්පාදන සැලැස්මක ව්‍යාපාරිකයාට වැදගත් විමට හේතු 02ක් ලියන්න.

(iii) නිෂ්පාදන සැලැස්මක ඇතුළත් තොරතුරු මොනවද ?

(iv) සොමි රස තල කැරළි න්‍යාපාරයේ දෛනික පිරිවැය පහත පරිදිය.

| | |
|---|---|
| තල රුː 4000.00 | සේවක වැටුප් රුː 3000.00 |
| හකුරු රුː 4000.00 | බෙදාහැරිමේ පිරිවැය රුː 1000.00 |
| තන කොළ රුː 400.00 | |

(a) මෙම ව්‍යාපාරයේ දෛයිනික මුළු පිරිවැය සොයන්න.

(v) මෙම ව්‍යාපාරයේ පරිහරණය කරනු ඇතැයි සිතන අනිකුත් යෙදවුම් හා එහි නිෂ්පාදන ක්‍රියාවලිය ( පරිවර්තන ක්‍රියාවලිය ) කෙටියෙන් පැහැදිලි කරන්න.

7. (i) ව්‍යාපාරයක් සඳහා පරිපාලන සැලැස්මක ඇති  අවශ්‍යතාවය කෙටියෙන් පැහැදිලි කරන්න. ( කරුණු 02 )

(ii) ඔබේ පාසාල් පරිපාලන ව්‍යුහය දැක්වෙන සංවිධාන සටහන ඇඳ දක්වන්න.

(iii) පොදුවේ ඕනෑම ව්‍යාපාරයක් සඳහා අවශ්‍ය වන තනතුරු ලෙස.

| | |
|---|---|
| නිශ්පාදන කළමනාකරු | පරිපාලන නිළධාරි |
| මූල්‍ය කළමනාකරු | යන්ත්‍ර ක්‍රියාකරු |
| මානව සම්පත් කළමනාකරු | ගිනුම් ලිපිකරු |
| අලෙවි කළමනාකරු | දක්විය හැකිය |

(a) මෙයින් ඔබ කැමති දෙදෙනෙකුගේ කාර්‍යයන් හා වගකීම් 01 බැගින් ලියන්න.

(iv) සරත්ගේ පියාගේ ව්‍යාපාරය සඳහා පරිපාලන සැලැස්මක් සකස් කිරිමට අවශ්‍ය බව පවසා පහත පරිපාලන වියදම් ලබා දෙන ලදි.

| | |
|---|---|
| කළමනාකරු  වේතනය | රුː 25000.00 |
| සේවක වැටුප් | රුː 80000.00 |
| රක්ෂණ ගාස්තු | රුː 2000.00 |
| දුරකථන වියදම් | රුː 1500.00 |
| ලිපි ද්‍රව්‍ය | රුː500.00 |

(a) මාසික මුළු පරිපාලන වියදම ගණනය කරන්න.

(v) ඇගළුම් කර්මාන්ත ශාලාවක ඔබ නිෂ්පාදන කළමනාකරු යයි සිතන්න. එහිදි ඔබට පැවරෙන කාර්‍යයන් 02ක් ලියන්න.